# 1 ලූක් ශුභාරංචියේ කතුවරයා




1.1 රූපය - ලූක්තුමා

ටීචර් : පුතේ, දෙවියන් වහන්සේ අපට විශේෂ හැකියා දී තිබෙනවා. ඒවා දියුණු කර ගෙන, අන් අයට සේවය කළ හැකි වැඩදායක පුද්ගලයන් වීම තමයි අපේ වගකීම වෙන්නේ. මම, පුංචි කාලයේ ඉඳලා ම ගුරුවරියක් වෙන්න ආශාවෙන් සිටියේ. මම කැමති උගන්වන්න; දරුවන්ට හොඳ නරක කියලා දෙන්න. ඉතින් අද මම ගුරුවරියක්. අවිශ්ක ඔයාගේ අනාගත බලාපොරොත්තුව මොකක් ද?

අවිශ්ක : ටීචර්, මම කැමති විශේෂඥ වෛද්‍යවරයෙක් වෙලා අසරණ රෝගීන්ට පිහිට වෙන්න.

ටීචර් : බොහෝ ම හොඳයි. ඔයා මහන්සි වෙලා ඉගෙන ගන්න ඕනේ.
කසුන්, පුතේ ඔයා ලොකු වුණා ම මොනවා ද කරන්න හිතන්නේ?

කසුන් : මම කැමති පියතුමෙක් වෙන්න. මම පූජාවට උදව් වෙන සමිතියෙත් ඉන්නවා. මට වුවමනා හැම දෙනාට ම සේවය කරන්න.

ටීචර් : බොහෝ ම හොඳ උතුම් අදහසක්. අපි කසුන්ගේ බලාපොරොත්තුව ඉෂ්ට වෙන්න කියලා යාච්ඤා කරමු.

තිළිණ : ටීචර්, මම කැමති ලේඛකයෙක් වෙන්න. මට ඕනේ පොත් ගොඩක් ලියන්න.

ටිචර් : තිළිණ, ඔයාට පුළුවන් මුළු සමාජය ම වෙනස් කරන්න. මිනිසුන්ට හොඳ ආකල්ප ඇති කරන්න. ලේඛකයෙක් කියන්නේ මහා බලවතෙක්.

ටීචර් : අද මම ඔයාලාට කතා කරන්න යන්නෙත් දක්ෂ ලේඛකයෙක් ගැනයි. මුළු ලෝකය ම පිළිගෙන තියෙනවා ඔහු දක්ෂ කර්තෘවරයෙක් කියලා. ඔහුගේ කතා වස්තුව වුණේ දේව පුත්‍ර ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ. ඔහු නමින් ශුද්ධ වූ ලූක් තුමා.

අප ගැලවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ තොරතුරු ඉතා මනහර ලෙස ලූක් තුමාගේ ශුභාරංචියේ ඉදිරිපත් කරයි. මෙය බුද්ධිමත් සාහිත්‍යකරුවකුගේ නිර්මාණයකි. කතුවරයා දක්ෂ ලේඛකයෙකු පමණක් නොව ඉතිහාසඥයෙක්, චිත්‍ර ශිල්පියෙක් හා වෛද්‍යවරයෙක් ද වෙයි. ශුභාරංචි ග්‍රන්ථයක් රචනා කරන ලද එක ම විජාතිකයා හෙවත් අන්‍ය ජාතිකයා (ජුදා ජාතියට අයත් නොවන්නා) ශුද්ධ වූ ලූක් තුමා වේ. ශුභාරංචියේ අඩංගු බොහෝ කරුණු අසා දැන ගත් ඒවා බව පිළිගැනෙයි. ශුද්ධ වූ සභා සම්ප්‍රදාය අනුව එතුමා කරුණු දැන ගත්තේ මරිය තුමියගෙනි.

ශුද්ධ වූ ලූක් තුමා ලූක් ශුභාරංචියේ පමණක් නොව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි ද කතුවරයා වේ. මෙම කෘතින් දෙකෙහි ම කර්තෘගේ නම සඳහන් නොකළ ද භාෂාව හා ශෛලිය සැලකිල්ලට ගත් විට එක ම ලේඛකයෙකුගේ බව තහවුරු වේ. අපෝස්තලික යුගයේ කිතුනුවකු වන මෙතුමාට ග්‍රීක භාෂාව හැසිරවීමෙහිලා මනා හැකියාවක් තිබිණි.

ශුභාරංචියෙහි ආරම්භක සිද්ධිය වන්නේ සෙකරියස් තුමාගේ යාග පූජාවයි. පුරාණ ගිවිසුමේ යාග පූජාවලට ගවයා භාවිත වූ නිසා ලූක් ශුභාරංචියේ සංකේතය ගවයා වේ.

ලූක් තුමා තවත් දක්ෂ ලේඛකයෙකු වන ශුද්ධ වූ පාවුලු තුමාගේ මිත්‍රයෙකි. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙන් පමණක් නොව පාවුලු තුමාගේ ලිපිවලින් ද මේ බව සනාථ වේ. පාවුලු තුමා රෝමයේ සිරගත ව සිටි විට ලූක් තුමා ද එහි වූ බව පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ පෙන්නුම් කරයි:

- "ලූක් පමණක් මා සමග සිටී. මාක් ඔබ සමග කැඳවා ගෙන එන්න. මාගේ වැඩට ඔහු ප්‍රයෝජනවත් සහකාරයෙකි" (2 තිමෝති 4:11).
- "මාගේ හවුල් සේවකයන් වන මාක් ද .... ලූක් ද ඔබට ආචාර කරති" (පිලෙමොන් 1:24).
- "අපේ හිතවත් ලූක් නම් වෛද්‍යවරයා ද ... ඔබට ආචාර කරති" (කොලොස්සි 4:14).

පාවුලු තුමා සමග ලූක් තුමා දෙවන හා තෙවන ධර්මදූත චාරිකා සඳහා සහභාගි වී ඇත. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ලියන ලූක් තුමා "අප" "අපි" යනුවෙන් සඳහන් කරන අවස්ථා එතුමා එම චාරිකාවලට සහභාගී වූ බව පෙන්නුම් කරයි.

ඔවුන්ට සුබ අස්න දේශනා කරන්නට දෙවියන් වහන්සේ අප කැඳෙව් බව ඔහුගේ දර්ශනයෙන් තේරුම් ගත් අපි එකෙණෙහි ම මසිදෝනියට යන්නට සැරසුණෙමු. එහෙයින් අපි ත්‍රෝවසෙන් නැව් නැගී කෙළින් ම සමොත්‍රාසියට ද පසුවද නෙයාපොලිසියට ද යාත්‍රා කර, එයින් මසිදෝනියේ දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයක් වූ ද රෝම ජනපදයක් වූ ද පිලිප්පියට අවුත් එහි කීප දවසක් නැවතී සිටියෙමු... ඈ ද ඇගේ ගෙයි වැසියන් ද බෞතීස්ම ස්නාපනය ලැබූ පසු, ඈ කතා කොට, 'මම සැබවින් ම ස්වාමීන් වහන්සේ අදහන කෙනෙකැ යි ඔබ පිළිගන්නවා නම්, මාගේ ගෙදරට අවුත් එහි නැවතුණ මැනවයි' අපෙන් උදක් ම ඉල්ලා අප කැමති කරවා ගත්තා ය. අප යාච්ඤා කරන තැනට යද්දී, ගුප්ත දෑ හෙළි කරන ආත්මයක් ආවේශ වූ පේන කීමෙන් ස්වකීය ස්වාමිවරුන්ට බොහෝ ලාභ උපදවා දුන් එක්තරා වහල් තරුණියක් අපට හමු වූවා ය. ඈ පාවුලුත් අපත් පසුපස එමින්, මේ අය ගැළවීමේ මාර්ගය අපට ප්‍රකාශ කරන පරමෝත්තම දෙවියන් වහන්සේගේ දාසයෝ යයි මොරගසා කීවා ය.

(ක්‍රියා 16:10-17)

ක්‍රියා 21:1, 21:7, 21:12 හා 21:15 යන පාඨ ද පාවුලු තුමාගේ ධර්ම දූත චාරිකාවලට ලූක් තුමා සහභාගි වූ බවට උදාහරණ ය.

ලූක් තුමා මෙන් ශුභාරංචිය පතළ කිරීමට අපේ හැකියා යොදා ගත යුතු වේ. දෙවියන් වහන්සේ දුන් දක්ෂතාවලින් උන්වහන්සේ පසසමු. අපගේ ලේඛන හැකියාවෙන් දේව වචනය පතළ කිරීමට විවිධ නිර්මාණ කිරීමට යොමු වෙමු. පාසලේ දී බිත්ති පුවත් පතට හා අනෙකුත් මාධ්‍යවලට අපේ නිර්මාණ යොමු කරමු. අන් අය ද ඒ සඳහා උනන්දු කරමු. ශුද්ධ වූ ලූක් තුමා ශුභාරාංචිය ලිවීමෙන් මුළු මිනිස් වර්ගයාට ම කර ඇති යහපත අගය කරමින් ඉන් උපරිම ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරමු.

**ක්‍රියාකාරකම**

1. ලූක් තුමා පිළිබඳ ඔබ කැමති නිර්මාණයක් කරන්න.
2. ඔබගේ නිර්මාණය ළමා ප්‍රදීපයට හෝ වෙනත් පුවත් පතකට යොමු කරන්න.

**ජීවිතයට බිඳක්**

***ශුභ වදනෙහි පණිවුඩකරුවකු වන්න.***